# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

# අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI) සඳහා ඉල්ලීමයි

# උපදේශන සේවා - තනි පුද්ගල තෝරාගැනීම

## පැවරුම් ශීර්ෂය : තනි පුද්ගල උපදේශකයින් බඳවා ගැනීම

## යොමු අංකය: DSD/HO/18/Pr/05/08/2025

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මූලික බැංකු පද්ධතියක් (Core Banking System) ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශන සේවා සැපයීමට අභිලාෂ ප්‍රකාශ කිරීම් කැඳවීමට අපේක්ෂා කෙරේ. මෙම උපදේශන සේවාව යටතේ පහත සඳහන් තනතුරු සඳහා මාස 12ක කාලසීමාවකට තනි පුද්ගල උපදේශකයින් බඳවා ගනු ලැබේ.

| තනතුර | තනතුරු ගණන | කොන්ත්‍රාත් අංකය |
|---|---|---|
| ලංසු ලිපි ලේඛන සැකසීම සහ මූලික බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා උපදේශක | (තනතුරු 01) | DSD/HO/18/Pr/05/08/2025 |

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව, මෙම සේවාව සැපයීම සඳහා ඔවුන්ගේ අභිලාෂ ප්‍රකාශ කරන මෙන් උනන්දුවක් දක්වන සුදුසුකම්ලත් "උපදේශකයින්" හට ආරාධනා කර සිටියි. අභිලාෂ උපදේශකයින් මෙම සේවාවන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සහ අදාළ පළපුරුද්ද ඇති බව සනාථ කරමින් අයවැය යෝජනා සමග ජීව දත්ත පත්‍රිකා (CVS) සැපයිය යුතුය. කෙටි ලැයිස්තුගත කිරීමේ තීර්ණායක වනුයේ, අධ්‍යාපන සුදුසුකම් සේවා පළපුරුද්ද සහ සමාන ව්‍යාපෘතිවලට සේවා පළපුරුද්ද සහ සිදුකර ඇති පර්යේෂණ ප්‍රකාශන වේ.

මෙම පැවරුම සඳහා වන විස්තරාත්මක යොමු අනුදේශ (TOR) පහත වෙබ් අඩවියෙන් ලබාගත හැක. http://www.samurdhi.gov.lk

**සුදුසුකම් :**

- ICT / පරිගණක විද්‍යාව/ පද්ධති කළමනාකරණය පිළිබඳ උපාධිය
- ICT ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ අවම වශයෙන් අවුරුදු 05 ක පළපුරුද්ද
- මූල්‍ය ආයතනයක මූලික බැංකු පද්ධති (Core Banking Systems) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔප්පු කරන ලද විශේෂඥ දැනුම.
- බැංකු පරිගණකගත කිරීමේ ව්‍යාපෘති පිළිබඳ පෙර පළපුරුද්ද.

අභිලාෂ ප්‍රකාශ කිරීම් ලිඛිත ආකෘතියෙන් 2026.01.13 දින ප.ව. 2.00ට පෙර පහත ලිපිනයෙහි පරිපාලන අංශයේ ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය යුතුය. නැතහොත් adsamurdhi2014@gmail.com වෙත විද්‍යුත් තැපැලෙන් එවිය යුතුය.

**සභාපති, දෙපාර්තමේන්තු උපදේශන ප්‍රසම්පාදන කමිටුව,**
**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**4 වන මහල, අදියර 01, සෙත්සිරිපාය, බත්තරමුල්ල.**
**දුරකථන : 0112873795 (විමසීම් සඳහා)**